
# Project 127
# 127 වන ව්‍යාපෘතිය

127

DP EDUCATION Coding School



micro:bit

ආරම්භ කරන්න

LIVEWORKSHEETS

Dog's Challenge Game එකක් නිර්මාණය කරමු.


❖ මෙම Game එකේදී එක් LED බල්බයකින් Dog(බල්ලා) ද,
අනෙක් LED බල්බයෙන් Bone(මස් කටුව) ද නිරූපණයවේ.

❖ මෙහිදී Micro bit board එක විවිධ දිශාවන්ට හැරවීමෙන් බල්ලා විවිධ දිශාවන් වලට ගෙන යා හැකි අතර බල්ලා මස් කටුවේ ස්පර්ශ වන විට ලකුණු 1 බැගින් වැඩි වේ.

❖ පළමුව on start block එකක් drag කර ගන්න.


❖ Game එක ආරම්භවීමේදී countdown එකක් නිර්මාණය කර ගමු.

ඒ සඳහා පහත පරිදි code සකස් කර ගන්න.




❖ බල්ලා සහා මස් කටුව display විමට පහත පරිදි code සකස් කරමු.


- මුලින්ම Dog හා Bone ලෙස Variable දෙකක් සකස් කර ගන්න.
- දැන් set Dog to block එකක් drag කර ගන්න.
- 1 සඳහා Game වල තිබෙන create sprite block එකක් එක් කර ගන්න.
- එහි x හා y සඳහා Math වල තිබෙන pick random block එකක් එක් කර ගන්න.
- දැන් Game වල තිබෙන set brightness to block එකක් drag කර ගන්න.
- එහි අගය 188 ලෙස ලබා දෙන්න.
- දැන් variable වල තිබෙන set Bone to block එක drag කර ගන්න. 1 සඳහා Game වල තිබෙන create sprite at block එකක් drag කර ගන්න.
- පහත සඳහන් පරිදි code සකස් කරන්න.




LIVEWORKSHEETS

❖ බල්ලා මස් කටුවේ ස්පර්ශ වූ විට ලකුණු එකතු වන ආකාරය නිර්මාණය කරමු.

- මුලින්ම Loops වල තිබෙන while do block එකක් set Bone to block එකට පහළින් එක් කර ගන්න.
- ඒ තුළට Logic වල තිබෙන if then block එකක් drag කර ගන්න.
- If then block එකේ true සඳහා Game වල තිබෙන is touching block එකක් drag කර ගන්න.
- එහි is ඉදිරියෙන් Dog ලෙසත් touching ඉදිරියෙන් Bone ලෙසත් සකස් කර ගන්න.
- If then block එක තුළට Game වල තිබෙන set to block දෙකක් drag කර ගන්න.
- පසුව Game වල තිබෙන Change score by code block එකක් drag කර ගන්න.
- එම code පහත පරිදි සකසා ගන්න.




LIVEWORKSHEETS

❖ බල්ලා මස් කටුවේ ස්පර්ශ වූ විට 100ms කදි මස් කටුව වෙනත් ස්ථානයකට ගමන් කිරිම සඳහා code සකස් කරමු.

- Logic වල තිබෙන if code block එකක් කලින් එක් කල if code block එකට පහලින් එක් කර ගන්න.
- එහි true සඳහා Logic වල තිබෙන සමාන ලකුණ සහිත code block ඒක එක් කර ගන්න.
- සමාන ලකුණ වෙනුවට විශාල ලකුණ තෝරන්න.
- 0 වෙනුවට input වල තිබෙන acceleration (mg) code block එකක් drag කර ගන්න.එය X ලෙස තෝරන්න.
- දැන් Game වල තිබෙන Bone change by block එකක් drag කර ගන්න.
- ඊට පහලින් Basic වල තිබෙන pause(ms)100 block එකක් drag කර ගන්න.
- පහත ආකාරයට code සකසා ගන්න.




- නැවත එම code එක Duplicate කර පහත පරිදි code වෙනස් කර ගන්න.





LIVEWORKSHEETS

- නැවතත් එම code එක Duplicate කර x වෙනුවට y යොදා පහත පරිදි තොරතුරු වෙනස් කර ගන්න.




- එම code එකත් Duplicate කර පහත පරිදි තොරතුරු වෙනස් කර ගන්න.




LIVEWORKSHEETS